පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව අංක 79
ආයතනයේ නම :- වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
01	මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	සේවා සපයන බාහිර පාර්ශවයන් සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ එම බැරකම්වලට එළඹීම් නොමැත. මු.රේ.94 (i) ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
02	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	(අ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ 2023.12.31 දින වනවිට අයකරගත නොහැකි ස්ථාන මාරුවී ගිය වයි.එම්.ෆසුල්ඩීන් මයාගේ රු.92,800.00 හා ආර්.නානායක්කාර මයාගේ රු.26,400.00 ක ණය ශේෂ දෙකක් ඇත. මෙම ණය ශේෂ දෙක 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව කපා හැරීම සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ලැබී ඇති අතර වැය විෂයක්ද අනුමත වී ඇත. ඒ අනුව මේ වසර තුල ප්‍රතිපාදන මාරුකර කපා හැරීමට කටයුතු කරනු ලැබේ. (ආ) වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂ වැඩ තහනමකට ලක්ව සිට 2023 වර්ෂයේ විශ්‍රාම වැටුප් අභිමිකර විශ්‍රාම යවා ඇති ජේ.ඒ ආරියසේන මහතාගෙන් රු.293,470.00 ක ආපදා ණය ශේෂයක් අයවිය යුතුව ඇත.මෙම ණය ශේෂය 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව කපා හැරීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට 2024.06.20 දිනැතිව ලිපියක් යොමු කර ඇත.

ඒ.බී.එන්. රාඛවත්ත
අදාළ
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයට
අංක 19, ශ්‍රීමත් ඒ.ඩී. ...

03	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ අඩු පාඩු අවම කරගෙන 2023 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමෙන් අවසාන විගණන මතය සත්‍ය හා සාධාරණ මතයක් ලැබී ඇත.
04	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	අමාත්‍යාංශය සතු වාහනවල රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශයේ නම පැහැදිලිව පෙනෙන පරිදි රාජ්‍ය ලාංඡනය සහිත මුද්‍රිත නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු සිදු කර ඇත.
05	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මෙම අමාත්‍යාංශයට අයත් වාහන 42 සඳහාම 267 වැනි පොදු ආකෘතිය පරිදි වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන යනු ලබන අතර එම ලොග් පොත්වල දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාහනයේ භාරකාරීත්වය මාරු කිරීම, ගමන් පිළිබඳව මාසික සාරාංශ හා පරීක්ෂක නිලධාරීන්ගේ සටහන් යන කරුණු හැර අනෙක් සියළු යාවත්කාලීනව පවත්වාගෙන පැවති බවත් උක්ත කරුණුද මේ වනවිටත් යාවත්කාලීන කිරීමට කටයුතු කර සමස්ත ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා ගැනීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.
06	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීම හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008 හි 2.3 වගන්ති ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පරීක්ෂාකාරී වීම පිණිස අධීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කලයුතු වන අතර ඒ සඳහා 2021 වර්ෂයේදී කාර්තුමය ඇගයීමක් සිදු කරන ලදි.මෙම අමාත්‍යාංශයේ එක් එක් අංශ විසින් ඉදිරිපත් කරන ලද අවසන් කාර්තුවට අදාල තොරතුරු පරීක්ෂා කිරීමේදී සංශෝධනයන් අවශ්‍ය නොවන බව ඒ ඒ අංශ මඟින් දන්වා තිබේ. එසේ වුවද උක්ත චක්‍රලේඛය මඟින් දක්වා ඇති පරිදි සාධාරණ කාල සීමාවකට පසු ඇගයීමක් සිදු කිරීම යෝග්‍ය වේ.එම කාල වකවානුව තුළ එම අධීක්ෂණය හා ඇගයීම සඳහා පත් කළ කමිටුවේ නිලධාරීන් දෙදනාගෙන් එක් අයකු පූර්ණ කාලීනව වෙනත් ආයතනයකට ස්ථාන මාරු වූ බැවින් වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

		2. කෙසේවෙතත් මේ වනවිට ගුවන්සේවා අංශයද මෙම අමාත්‍යාංශයට එක්වූ බැවින් එම අංශයද නියෝජනය වන පරිදි එකී සේවාවන් වඩාත් ඵලදායීව හා ගුණාත්මකව සිදු කිරීම සඳහා නව සාමාජිකයන් දෙදනකු පත් කල බව සඳහන් කරමි.ඒ අනුව ගුවන් සේවා අංශයද ඇතුළුව 2023 ජූනි 30 න් අවසන් අර්ධ වර්ෂය හා මේ දක්වා අධීක්ෂණය හා ඇගයීම ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකර එම වාර්තාවන් සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ලද බව කාරුණිකව දන්වා සිටිමි.
07	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2022 සහ 2023 වර්ෂයන් සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොමැති බව, ජාතික විගණන කාර්යාලයේ විගණන නිලධාරීන් විසින් පරීක්ෂා කිරීමේ දී පෙන්වා දුන් හෙයින්, 2023.09.15 දින වන විට 2022 වර්ෂයට අදාළ කාර්ය සාධන ගිවිසුම් සකස් කර අවසන් කරන බව ඔබ වෙත දන්වන ලදී. ඒ අනුව 2022 වර්ෂය සඳහා සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. 2023 වර්ෂයට අදාළ කාර්ය සාධන ගිවිසුම් 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා සකස් කළ යුතු බැවින් 2023 වර්ෂයට අදාළ කාර්ය සාධන ගිවිසුම් 2024.01.31 දිනට පෙර අත්සන් කිරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව දන්වා ඇත. ඒ අනුව 2023 වර්ෂයට අදාළව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
08	සලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වෛරසයේ අවදානම හේතුවෙන් බොහෝමයක් පුහුණු පාඨමාලාවන් එම පාඨමාලා පවත්වනු ලබන ආයතන මඟින් කල්දැමීම නිසා සහ මාර්ගගත (Online) ක්‍රමයට පැවැත්වීම හේතුවෙන් අපේක්ෂිත වූ පරිදි නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීමට නොහැකි විය. එබැවින්, 2021 වර්ෂය සඳහා සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතිණි. නමුත් 2022 වර්ෂයේදී 67% සහ 2023 වර්ෂයේදී 75% ක ප්‍රතිශත මට්ටමක් ළඟා කර ගෙන ඇත. මෙම වර්ෂයේදී (2024) 75% ක මට්ටම වඩා ඉහළ ප්‍රතිශතයක් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව කාරුණිකව දන්වා සිටිමි.